සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

62 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2018 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2018 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2018

පුරවැසි අධ්‍යාපනය I, II
குடியியற் கல்வி I, II
Civic Education I, II

2018.12.12 / 0830 - 1140

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

## පුරවැසි අධ්‍යාපනය I

**සැලකිය යුතුයි:**

(i) **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරන්න.
(iii) **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
(iv) එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

1. මිනිසාගේ පැවැත්ම සඳහා අත්‍යවශ්‍ය මූලික දේවල් හැඳින්වෙන නම කුමක් ද?
(1) වුවමනා (2) භාණ්ඩ හා සේවා (3) අවශ්‍යතා (4) නිෂ්පාදන

2. ශ්‍රී ලංකාවේ ප්‍රධාන නීති නිලධාරියා වන්නේ,
(1) අගවිනිසුරුතුමා ය. (2) අධිකරණ ඇමතිතුමා ය.
(3) නීතිපතිතුමා ය. (4) ඔම්බුඩ්ස්මන්තුමා ය.

3. ඒකීය රාජ්‍යයන් පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) මහා බ්‍රිතාන්‍යය, ජපානය, ප්‍රංශය, ඇමරිකා එක්සත් ජනපදය
(2) ජපානය, නේපාලය, ප්‍රංශය, ශ්‍රී ලංකාව
(3) ඉන්දියාව, ශ්‍රී ලංකාව, මහා බ්‍රිතාන්‍යය, ප්‍රංශය
(4) ඇමෙරිකා එක්සත් ජනපදය, ඉන්දියාව, ජපානය, ප්‍රංශය

4. සංවර්ධනය මැනීම සඳහා භාවිත වන නූතන ක්‍රමයක් වන්නේ,
(1) දළ ජාතික නිෂ්පාදිතයයි. (2) ඒක පුද්ගල දළ ජාතික නිෂ්පාදිතයයි.
(3) මානව සංවර්ධන දර්ශකයයි. (4) ආර්ථික වර්ධන වේගයයි.

5. සංවර්ධනය වෙමින් පවතින රටවල් පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) නෝර්වේ, ජපානය, බංග්ලාදේශය, කැනඩාව
(2) ඉන්දියාව, සෝමාලියාව, ඉතියෝපියාව, සියරාලියෝන්
(3) බෙල්ජියම, මියන්මාරය, ප්‍රංශය, ජර්මනිය
(4) නේපාලය, ඕස්ට්‍රේලියාව, ස්විඩනය, ඇමෙරිකා එක්සත් ජනපදය

6. සෘජු ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමේදී ගැටලුවක් වන්නේ,
(1) රාජ්‍යයක විවිධ පක්ෂ පැවතීම ය.
(2) රාජ්‍යයක ජනගහනය අධික වීම ය.
(3) නියමිත කාල සීමාව තුළ මැතිවරණ පැවැත්වීම ය.
(4) පුරවැසියන්ගේ ආදායම් විෂමතාවක් පැවතීම ය.

7. ඒක පක්ෂ ක්‍රමයක් ඇති රටක් වන්නේ,
(1) මහා බ්‍රිතාන්‍යයයි. (2) ඇමෙරිකා එක්සත් ජනපදයයි.
(3) චීනයයි. (4) ඕස්ට්‍රේලියාවයි.

[දෙවැනි පිටුව බලන්න.

**8.** ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක ජනතාව සතු බලය හැඳින්වෙන්නේ,
(1) පරමාධිපත්‍ය බලය යනුවෙනි. (2) නීත්‍යානුකූල බලය යනුවෙනි.
(3) සර්වජන ඡන්ද බලය යනුවෙනි. (4) නීතියේ ආධිපත්‍ය බලය යනුවෙනි.

**9.** අනෙකුත් ජාත්‍යන්තර හා කලාපීය සංවිධාන සමග සාර්ක් සංවිධානය සන්සන්දනය කිරීමේදී සාක් සාමාජික රටවල් අතර සමීප සම්බන්ධතා දුර්වල මට්ටමක පැවතීමට හේතුවී ඇත්තේ,
(1) විවිධ ආගමික හා සංස්කෘතික ලක්ෂණවලින් සමන්විත වීම නිසා ය.
(2) ස්වාභාවික ආපදාවලට නිරන්තරයෙන් ලක්වීම නිසා ය.
(3) අවම සාක්ෂරතා මට්ටම්වලින් යුක්ත වීම නිසා ය.
(4) අභ්‍යන්තර දේශපාලන අර්බුද හා යුධමය තත්ත්වවල බලපෑමට ලක්වීම නිසා ය.

**10.** අයිතිවාසිකම් හා බැඳුණු සදාචාරාත්මක යුතුකම් සඳහන් වන පිළිතුර තෝරන්න.
(1) රජය විසින් පනවන බදු ගෙවීම (2) පරිසරය ආරක්ෂා කිරීම
(3) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව කටයුතු කිරීම (4) පොදු දේපළ ආරක්ෂා කිරීම

**11.** ශ්‍රී ලංකාවේ පළාත් සභාවක ප්‍රධාන ඇමතිවරයා පත්කරනු ලබන්නේ,
(1) ජනාධිපතිවරයා විසිනි. (2) ආණ්ඩුකාරවරයා විසිනි.
(3) අග්‍රාමාත්‍යවරයා විසිනි. (4) කථානායකවරයා විසිනි.

**12.** ශ්‍රී ලංකාවේ පරිපාලන ක්‍රියාවක් නිසා පුරවැසියකුගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය හා කඩවීම සම්බන්ධයෙන් පැමිණිලි කළ යුතු වන්නේ,
(1) ඔම්බුඩ්ස්මන්වරයාට ය. (2) නීතිපතිවරයාට ය.
(3) ජනාධිපතිවරයාට ය. (4) අග්‍රවිනිශ්චයකාරවරයාට ය.

**13.** රටක ජනතාව විසින් පිළිගෙන "සම්මත කරගත් ක්‍රියා කිරීමේ විධි" හඳුන්වනු ලබන්නේ,
(1) ආචාරධර්ම ලෙස ය. (2) සිරිත්විරිත් ලෙස ය.
(3) සංස්කෘතිය ලෙස ය. (4) සමාජය ලෙස ය.

**14.** බහුසංස්කෘතික සමාජයක පුරවැසියකු සතුවිය යුතු ගුණාංගයක් වන්නේ,
(1) අන්‍ය සංස්කෘතිවලට ගරු කිරීම ය. (2) මහජාතියේ සංස්කෘතියට ගරු කිරීම ය.
(3) අන්‍ය ආගම් වැළඳ ගැනීම ය. (4) අන්තර් විවාහ සිදු කිරීම ය.

**15.** දේශගුණ වෙනස්වීමේ ප්‍රතිඵලයක් **නොවන** සිද්ධියක් වන්නේ,
(1) සාගර ජල මට්ටම ඉහළ යාම ය. (2) එල්නිනෝ බලපෑම ඇති වීම ය.
(3) සුනාමි ඇති වීම ය. (4) පරිසර උෂ්ණත්වය ඉහළ යාම ය.

**16.** ජාතික රාජ්‍යයක ප්‍රධාන ලක්ෂණයක් වන්නේ,
(1) පාර්ලිමේන්තුවයි. (2) විධායකයයි.
(3) ආණ්ඩුවයි. (4) අධිකරණයයි.

**17.** බලය විමධ්‍යගත කිරීමේදී දැකිය හැකි විශේෂ ලක්ෂණයක් වන්නේ,
(1) විවිධත්වය තුළ එක්සත්කමක් ගොඩනගා ගැනීමයි.
(2) ලිඛිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් තිබීමයි.
(3) බලතල ඕනෑම අවස්ථාවක ආපසු පවරා ගත හැකි වීමයි.
(4) සියලුම තීරණ මධ්‍යම ආණ්ඩුව විසින් ගනු ලැබීමයි.

**18.** ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතනවලට අයත් **නොවන** කාර්යයක් වන්නේ,
(1) අතුරු පාරවල් ඉදිකිරීමයි. (2) මහජන වැසිකිළි ඉදිකිරීම හා නඩත්තු කිරීමයි.
(3) ප්‍රදේශයේ කුඩා පාසල් ඉදිකිරීමයි. (4) පොදු කියවීම් ශාලා පවත්වා ගෙන යාමයි.

**19.** පුද්ගලයාගේ අභ්‍යන්තර හා බාහිර හේතු පදනම් කරගෙන නිර්මාණය වන ගැටුම් හැඳින්වෙන්නේ,
(1) ගෝත්‍ර අතර ඇති වන ගැටුම් ලෙස ය. (2) දේශපාලන මතවාද මත ඇති වන ගැටුම් ලෙස ය.
(3) පුද්ගලයා තුළ නිර්මාණය වන ගැටුම් ලෙස ය. (4) සමාජීය සාධක මත ඇති වන ගැටුම් ලෙස ය.

**20.** එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය මගින් ළමයකු වශයෙන් හඳුනාගැනීමට භාවිත කරනු ලබන වයස් සීමාව කුමක් ද?
(1) වයස අවුරුදු 18 ට පහළ (2) වයස අවුරුදු 16 ට පහළ
(3) වයස අවුරුදු 15 ට පහළ (4) වයස අවුරුදු 14 ට පහළ

[තුන්වැනි පිටුව බලන්න.

**21.** ගෝලීයකරණය නිසා ශ්‍රී ලංකාව මුහුණ දී ඇති ධනාත්මක බලපෑමක් වන්නේ,
(1) ආර්ථිකය විවිධාංගීකරණය වීමයි.
(2) බුද්ධිගලනය වේගවත් වීමයි.
(3) දේශීය ළඳරු කර්මාන්ත විනාශ වීමයි.
(4) විදේශ ණය හා ආධාර මත යැපීමට සිදු වීමයි.

**22.** රටක පුරවැසියකු සතු මූලික අයිතිවාසිකම් ඇතුළත් කර ඇති ප්‍රධාන ලියවිල්ල හැඳින්වෙන නම කුමක් ද?
(1) මානව හිමිකම් ප්‍රඥප්තිය
(2) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව
(3) දණ්ඩ නීති සංග්‍රහය
(4) සමගාමී ලැයිස්තුව

**23.** මූලික අයිතිවාසිකම් සම්බන්ධයෙන් වන **අසත්‍ය** ප්‍රකාශය තෝරන්න.
(1) සියලුම මානව අයිතිවාසිකම් මූලික අයිතිවාසිකම් වේ.
(2) සියලුම මානව අයිතිවාසිකම් මූලික අයිතිවාසිකම් නොවේ.
(3) මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වීමේදී නීතිමය සහය ලබාගත හැකි ය.
(4) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළත් කර නොමැති වගන්ති මූලික අයිතිවාසිකම් නොවේ.

**24.** රටක සමාජ සාධාරණත්වය බිඳවැටීමට බලපාන හේතුවක් දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) රාජ්‍ය සේවය දේශපාලනීකරණය නොවීම
(2) ආර්ථික හා මානව සම්පත් හිඟ වීම
(3) රාජ්‍ය පාලනය කාර්යක්ෂම වීම
(4) අල්ලස හා දූෂණය ඉහළ යාම

**25.** පරිවර්තන ආර්ථිකවල දක්නට ලැබෙන ලක්ෂණයක් වන්නේ,
(1) පෞද්ගලික හා රාජ්‍ය ව්‍යවසාය යන අංශ දෙකම දක්නට ලැබීමයි.
(2) නිෂ්පාදන සාධකවල අයිතිය පෞද්ගලික අංශය සතු වීමයි.
(3) සහනාධාර හා මිල පාලන ක්‍රම ලිහිල් කිරීමට කටයුතු කිරීමයි.
(4) පාඩු ලබන රාජ්‍ය ව්‍යවසාය පෞද්ගලීකරණය කිරීමයි.

**26.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ආගමට මුල්තැන ලබා දී **නොමැති** රට කුමක් ද?
(1) ශ්‍රී ලංකාව (2) පාකිස්ථානය (3) ඉන්දියාව (4) බංග්ලාදේශය

**27.** සහමන්ත්‍රණය සහ කේවල් කිරීම බහුලව යොදා ගැනෙන අවස්ථා දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) කාර්මික ආරවුල්, වතු කම්කරු ආරවුල්
(2) පෞද්ගලික ආරවුල්, සේවක ආරවුල්
(3) පෞද්ගලික ආරවුල්, රාජ්‍ය ආරවුල්
(4) දේපළ ආරවුල්, පවුල් ආරවුල්

**28.** රාජ්‍යවල ප්‍රධාන ස්වරූප දෙක කුමක් ද?
(1) ජනාධිපති හා පාර්ලිමේන්තු රාජ්‍යය
(2) ඒකාධිපති හා ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යය
(3) ඒකීය හා සන්ධීය රාජ්‍යය
(4) ජාතික හා ප්‍රාදේශීය රාජ්‍යය

**29.** ජාත්‍යන්තර කම්කරු සංවිධානය (ILO) සම්බන්ධයෙන් වඩාත් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) ස්වාධීනව ආරම්භ වී පසුකාලීනව ජාතීන්ගේ සංගමයට අනුයුක්තව කටයුතු කිරීම
(2) ස්වාධීනව ආරම්භ වී පසුකාලීනව එක්සත් ජාතීන්ගේ සංවිධානයට අනුයුක්තව කටයුතු කිරීම
(3) එක්සත් ජාතීන්ගේ මහසභාව විසින් ආරම්භ කර කටයුතු කිරීම
(4) එක්සත් ජාතීන්ගේ සංවිධානය සමග සම්බන්ධ නොවී ස්වාධීනව කටයුතු කිරීම

**30.** සමාජ පරිසරය යනුවෙන් අදහස් කෙරෙනුයේ,
(1) මිනිසාගේ මැදිහත් වීමකින් තොරව ඇති වූ සංරචකයකි.
(2) මිනිසා විසින් ගොඩනගන ලද්දකි.
(3) භෞතික සංරචකවලින් ගොඩනගන ලද්දකි.
(4) භෞතික සංරචක අතර අන්තර් සම්බන්ධතාවලින් ගොඩනගන ලද්දකි.

**31.** තම රටේ යුක්තිය පසිඳලීමේ කාර්යය අවසන් වූ පසු ඉන් සෑහීමට පත් නොවන්නේ නම් පැමිණිලි කළ හැකි මානව හිමිකම් කමිටුව පිහිටා ඇත්තේ,
(1) සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය අනුව ය.
(2) ආර්ථික, සමාජීය හා සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය අනුව ය.
(3) සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය හා සම්බන්ධ පළමු වෛකල්පික සම්මුතිය අනුව ය.
(4) සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතියට එකතු කළ දෙවන වෛකල්පික සම්මුතිය අනුව ය.

[හතරවැනි පිටුව බලන්න.

32. බ්‍රිතාන්‍ය පාලන සමයේ හඳුන්වා දෙන ලද ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ අතුරෙන් ශ්‍රී ලාංකිකයින්ට වැඩි දේශපාලන අවස්ථා හිමිවූයේ කුමන ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයේදී ද?
(1) කෝල්බෲක්
(2) කෲව් මැකලම්
(3) මැනිං
(4) ඩොනමෝර්

33. ප්‍රජාතන්ත්‍රවාදී පාලන රටාවක් ඇති කිරීමට බලපාන වැදගත් සාධකයක් වන්නේ,
(1) රාජ්‍ය නොවන සංවිධාන දිරිමත් කිරීම ය.
(2) රාජ්‍ය සේවකයන්ට වැඩි බලතල ලබා දීම ය.
(3) ආණ්ඩු පක්ෂයේ කාර්යය විවේචනය කිරීම ය.
(4) නිදහස් ජනමාධ්‍යයක් පවත්වා ගෙන යාම ය.

34. මැතිවරණයකදී මහජනතාවට හිතකර ආණ්ඩුවක් බලයට පත් කර ගැනීමේදී බලපාන වැදගත් සාධකයක් වන්නේ,
(1) නිදහස් හා සාධාරණ මැතිවරණයක් පැවැත්වීම ය.
(2) නීතියේ ආධිපත්‍යය ආරක්ෂා වී තිබීමය.
(3) ජනතාවට ප්‍රමාණවත් දේශපාලන අවබෝධයක් තිබීම ය.
(4) සෑම දෙනාටම සමාන අයිතිවාසිකම් හිමි වීම ය.

35. ජාත්‍යන්තර දේශපාලනය තුළ බලවත් රටවල් විසින් දුබල රටවලට බලපෑම් කිරීම සඳහා භාවිත කරනු ලබන්නක් වන්නේ,
(1) සංස්කෘති සහයෝගයයි.
(2) අධ්‍යාපන සංවර්ධනයයි.
(3) ආගමික චාරිත්‍රයි.
(4) ජාත්‍යන්තර වෙළෙඳාමයි.

36. රටක පුරවැසියන්ට ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයකට සහභාගි වීමට **නොහැකි** වන්නේ පහත සඳහන් කුමන අවස්ථාවේදී ද?
(1) ඡන්දය ප්‍රකාශ කිරීමෙන් තම නියෝජිතයා තෝරා ගැනීම
(2) ඡන්ද අපේක්ෂකයකු ලෙස ඉදිරිපත් වීම
(3) අධ්‍යාපනය, සෞඛ්‍යය වැනි දේ නොමිලයේ ලබා දීම
(4) ආණ්ඩුවේ ක්‍රියාකාරිත්වය විවේචනයට ලක් කිරීම

37. එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයේ නිත්‍ය සාමාජික රටවල් පමණක් දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) ජපානය, චීනය, ඉන්දියාව, ප්‍රංශය
(2) චීනය, බ්‍රිතාන්‍යය, ප්‍රංශය, ඇමෙරිකා එක්සත් ජනපදය
(3) ඇමෙරිකා එක්සත් ජනපදය, රුසියාව, ඉන්දියාව, ඕස්ට්‍රේලියාව
(4) බ්‍රිතාන්‍යය, ඇමෙරිකා එක්සත් ජනපදය, ප්‍රංශය, ජර්මනිය

38. ගැටුම් අවම කර ගැනීම සඳහා පුරවැසියකු තුළ වර්ධනය කරගත යුතු සමාජ ගුණාංගය වන්නේ,
(1) ජීවිත හානි වැළැක්වීමයි.
(2) මානසික ආතතිය අවම කිරීමයි.
(3) අන්මත ගරු කිරීමයි.
(4) නිර්මාණාත්මක චින්තනය වර්ධනයයි.

39. පහත 'අ' තීරුවේ සඳහන් අධිකරණ ආයතන සමග 'ආ' තීරුවේ ඇති නඩු කටයුතු නිවැරදිව ගළපන ලද පිළිතුර තෝරන්න.

| 'අ' | 'ආ' |
|---|---|
| 1 - ශ්‍රේෂ්ඨාධිකරණය | A - මහජන ආරක්ෂාව සම්බන්ධ වැරදි |
| 2 - අභියාචනාධිකරණය | B - විවාහ සම්බන්ධ නඩු |
| 3 - මහාධිකරණය | C - ආදායම් පිළිබඳ නඩු |
| 4 - මහේස්ත්‍රාත් අධිකරණය | D - ජනාධිපතිවරණ පෙත්සම් විභාග |
| | E - මිනීමැරුම් සම්බන්ධ නඩු |
| | F - වාණිජ ආරවුල් විසඳීම |
| | G - හේබියස් කෝපුස් ආඥා නිකුත් කිරීම |

(1) A, G, B, E
(2) B, D, F, G
(3) D, G, E, A
(4) G, E, F, D

40. පහත සඳහන් වන්නේ වායු දූෂණය සිදුවන ක්‍රම කිහිපයකි.
A - ගිනිකඳු පිපිරීම
B - ප්‍රවාහන කටයුතු
C - දූවිලි කුණාටු
D - ලැව් ගිනි
E - ගුවන් යානා භාවිතය

ඉහත සඳහන් ක්‍රම අතුරෙන් ස්වාභාවික ක්‍රම පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) A, B, E
(2) A, C, D
(3) B, C, E
(4) C, D, E

* *

/පස්වැනි පිටුව බලන්න.

+94 71 800 8533 / +94 77 088 2228 WWW.PADANAMAPUBLICATION.LK

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**62 S I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2018 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2018 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2018

පුරවැසි අධ්‍යාපනය I, II
குடியியற் கல்வி I, II
Civic Education I, II

## පුරවැසි අධ්‍යාපනය II

※ **පළමුවන** ප්‍රශ්නය අනිවාර්ය වේ.

※ **පළමුවන** ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළු ව, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

**1.** (i) මානව අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීමේදී විශේෂ අවධානයට යොමු වූ පුද්ගල කණ්ඩායම් **දෙකක්** සඳහන් කරන්න.

(ii) ලෝකයේ යුදමය අරමුණු පදනම් කරගෙන බිහි වූ කලාපීය සංවිධාන **දෙකක්** නම් කරන්න.

(iii) පරිසරය මගින් මිනිසාට ලැබෙන ආර්ථික උපකාරක සේවා **දෙකක්** ලියන්න.

(iv) තරගකාරී පක්ෂ ක්‍රමයක යහපත් ලක්ෂණ **දෙකක්** ලියන්න.

(v) යහපාලන ක්‍රමයක මූලික ගුණාංග **දෙකක්** නම් කරන්න.

(vi) නීතිය ක්‍රියාත්මක වන ආකාරය අනුව එහි ප්‍රධාන කොටස් **දෙක** සඳහන් කරන්න.

(vii) ගැටුම් නිරාකරණය සඳහා අනුගමනය කළ හැකි ක්‍රම **දෙකක්** ලියන්න.

(viii) සංවර්ධන ක්‍රියාවලියේදී අවධානය යොමු කළ යුතු ප්‍රධාන අංශ **දෙකක්** නම් කරන්න.

(ix) සෝල්බරි ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ මගින් ශ්‍රී ලංකාවට එක්වූ අංග **දෙකක්** නම් කරන්න.

(x) ස්විට්සර්ලන්ත සන්ධීය ක්‍රමයේ සුවිශේෂ ලක්ෂණ **දෙකක්** සඳහන් කරන්න.

(ලකුණු 02 × 10 = 20 යි)

**2.** ගැටුම් ඇති වීම පුද්ගලයාට මෙන්ම සමාජයට ද සෘජුවම බලපායි.

(i) ගැටුමක් ඇති වීමට බලපාන හේතු **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(ii) අන්තර්ජාතික වශයෙන් ගැටුම් ඇති විය හැකි අවස්ථා **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) ගැටුම් විසඳීම සඳහා සමථකරණය යොදාගත හැකි අවස්ථා **තුනක්** නම් කර, ඉන් එකක් යොදාගන්නා ආකාරය විස්තර කරන්න. (ලකුණු 05 යි)

**3.** ආර්ථිකයක සිදුවන ක්‍රියාවලි අතර නිෂ්පාදන ක්‍රියාවලිය වැදගත් වේ.

(i) නිෂ්පාදන සාධක **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) ආර්ථිකයක නිෂ්පාදන ක්‍රියාවලිය සිදුවන ප්‍රධාන අංශ **තුන** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) නිෂ්පාදිත භාණ්ඩ පරිභෝජනය කෙරෙන ආකාර අනුව බෙදිය හැකි කොටස් **තුන** නම් කර, ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05 යි)

**4.** ශ්‍රී ලංකාවේ නීතිය ක්‍රියාත්මක කිරීම සඳහා විවිධ අධිකරණ ආයතන පිහිටුවා තිබේ.

(i) ශ්‍රී ලංකාවේ අධිකරණ පද්ධතියේ ඉහළම අධිකරණ **දෙක** පිළිවෙළින් නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන විශේෂ නීති වර්ග **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) රටක නීති පැනවීමට බලපාන සාධක **තුනක්** නම් කර, ඉන් එකක් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

[හයවැනි පිටුව බලන්න.

**5.** රාජ්‍යයක බලය මධ්‍යම ආණ්ඩුව හා ප්‍රාන්ත ආණ්ඩු අතර බෙදා ගැනීම සන්ධීය රාජ්‍යය නම් වේ.

(i) සන්ධීය ආණ්ඩු පවතින රටවල් **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) සන්ධීය ආණ්ඩු ක්‍රමයක් ඇති වීමට බලපාන කරුණු **තුනක්** දක්වන්න. (ලකුණු 03 යි)

(iii) සන්ධීය ආණ්ඩු ක්‍රමයක අයහපත් ලක්ෂණ **තුනක්** සඳහන් කර, ඉන් එකක් විස්තර කරන්න. (ලකුණු 05 යි)

**6.** ආර්ථික වර්ධනය හා සංවර්ධනය යනු එකිනෙකට වෙනස් සංකල්ප දෙකකි.

(i) 'සංවර්ධනය' යන සංකල්පය අර්ථ දක්වන්න. (ලකුණු 02 යි)

(ii) සංවර්ධනය වෙමින් පවත්නා රටක් වශයෙන් පැවතිය ද ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන සංවර්ධිත රටවලට අයත් ලක්ෂණ **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)

(iii) ශ්‍රී ලංකාවේ සංවර්ධන අභියෝගය ජය ගැනීමට ගෙන ඇති ක්‍රියාමාර්ග **තුනක්** සඳහන් කර, ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05 යි)

**7.** ලෝකයේ විවිධාකාර කලාපීය සංවිධාන බිහි වේ.

(i) කලාපීය සංවිධාන ඇති වීමට බලපෑ මූලික හේතු **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ii) ආසියාන් සංවිධානයේ සාමාජික රටවල් **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)

(iii) ආසියාන් සංවිධානයේ අරමුණු **දෙකක්** සඳහන් කර, ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

* * *

PADANAMA PUBLICATION පඩනම ප්‍රකාශන

රහසායි

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

# අ.පො.ස.(සා.පෙළ) විභාගය - 2018
# க.பொ.த (சா.தர)ப் பரீட்சை - 2018

විෂයය අංකය / பாட இலக்கம்: 62

විෂයය / பாடம்: පුරවැසි අධ්‍යාපනය

## I පත්‍රය - පිළිතුරු
## Iபத்திரம் - விடைகள்

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරෙහි අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරෙහි අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරෙහි අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරෙහි අංකය விடை இல. |
|---|---|---|---|---|---|---|---|
| 1. | 03 | 11. | 02 | 21. | 01 | 31. | 03 |
| 2. | 03 | 12. | 01 | 22. | 02 | 32. | 04 |
| 3. | 02 | 13. | 03 | 23. | 01 | 33. | 04 |
| 4. | 03 | 14. | 01 | 24. | 04 | 34. | 03 |
| 5. | 02 | 15. | 03 | 25. | 04 | 35. | 04 |
| 6. | 02 | 16. | 03 | 26. | 03 | 36. | 03 |
| 7. | 03 | 17. | 03 | 27. | 01 | 37. | 02 |
| 8. | 01 | 18. | 03 | 28. | 03 | 38. | 03 |
| 9. | 04 | 19. | 03 | 29. | 02 | 39. | 03 |
| 10. | 02 | 20. | 01 | 30. | 02 | 40. | 02 |

විශේෂ උපදෙස් / விசேட அறிவுறுத்தல் } එක් පිළිතුරකට ලකුණු / ஒரு சரியான விடைக்கு **01** බැගින் / புள்ளி வீதம்

මුළු ලකුණු/ மொத்தப் புள்ளிகள் **01× 40 = 40**

---

පහත නිදසුනෙහි දක්වෙන පරිදි බහුවරණ උත්තරපත්‍රයේ අවසාන තීරුවේ ලකුණු ඇතුළත් කරන්න.
கீழ் குறிப்பிடப்பட்டிருக்கும் உதாரணத்திற்கு அமைய பல்தேர்வு வினாக்களுக்குரிய புள்ளிகளை பல்தேர்வு வினாப்பத்திரத்தின் இறுதியில் பதிக.

නිවැරදි පිළිතුරු සංඛ්‍යාව / சரியான விடைகளின் தொகை: 25 / 40

I පත්‍රයේ මුළු ලකුණු / பத்திரம் I இன் மொத்தப்புள்ளி: 25 / 40

# අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2018

## 62 - පුරවැසි අධ්‍යාපනය I, II

## II පත්‍රයේ අභිමතාර්ථ

- විෂය නිර්දේශයේ සියලු ඒකක ආවරණය වන පරිදි සුවිශේෂී කරුණු පිළිබඳ දැනුම පරීක්ෂා කිරීම
- ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක ගැටුම් ඇතිවීම හේතු හා ගැටුම් නිරාකරණය සඳහා අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග පිළිබඳව තුලනාත්මක අවබෝධය පරීක්ෂා කිරීම
- ආර්ථික ක්‍රමයක නිෂ්පාදන සාධක, නිෂ්පාදනය සිදු වන අංශ හා නිෂ්පාද භාණ්ඩවල ස්වභාවය පිළිබඳව දැනුම හා අවබෝධය පරීක්ෂා කිරීම
- මානව අයිතිවාසිකම් හා ඒවායේ වැදගත්කම පිළිබඳව දැනුම, අවබෝධය හා ආකල්ප පරීක්ෂා කිරීම
- ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක අධිකරණ පද්ධතීන් හා ඒවායේ ක්‍රියාකාරිත්වය පිළිබඳ විශ්ලේෂණාත්මක දැනුම හා අවබෝධය පරීක්ෂා කිරීම
- බලය බෙදා හැරීම හෝ විමධ්‍යගත කිරීමේ අවශ්‍යතාව වැදගත්කම හා වාසි අවාසි පිළිබඳ විමර්ශනාත්මක දැනුම පිළිබඳ පරීක්ෂා කිරීම.
- ආණ්ඩුවේ විවිධ ස්ථරයන්හි බලතල, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුම, අවබෝධය හා ආකල්ප පරීක්ෂා කිරීම
- පාරිසරික ගැටලු හා තිරසාර සංවර්ධනය පිළිබඳව රාජ්‍යයේ හා පුරවැසියාගේ යුතුකම් හා ආකල්ප පිළිබඳව පරීක්ෂා කිරීම
- ජාත්‍යන්තර සබඳතා ඇති කර ගැනීමේ අවශ්‍යතාව, වැදගත්කම මෙන්ම වාසි අවාසි පිළිබඳ දැනුම හා අවබෝධය පරීක්ෂා කිරීම

## II පත්‍රය - ප්‍රශ්න හා පිළිතුරු

1. (i) මානව අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීමේදී විශේෂ අවධානයට යොමු වූ පුද්ගල කණ්ඩායම් **දෙකක්** සඳහන් කරන්න.
(ii) ලෝකයේ යුදමය අරමුණු පදනම් කරගෙන බිහි වූ කලාපීය සංවිධාන **දෙකක්** නම් කරන්න.
(iii) පරිසරය මගින් මිනිසාට ලැබෙන ආර්ථික උපකාරක සේවා **දෙකක්** ලියන්න.
(iv) තරගකාරී පක්ෂ ක්‍රමයක යහපත් ලක්ෂණ **දෙකක්** ලියන්න.
(v) යහපාලන ක්‍රමයක මූලික ගුණාංග **දෙකක්** නම් කරන්න.
(vi) නීතිය ක්‍රියාත්මක වන ආකාරය අනුව එහි ප්‍රධාන කොටස් **දෙක** සඳහන් කරන්න.
(vii) ගැටුම් නිරාකරණය සඳහා අනුගමනය කළ හැකි ක්‍රම **දෙකක්** ලියන්න.
(viii) සංවර්ධන ක්‍රියාවලියේදී අවධානය යොමු කළ යුතු ප්‍රධාන අංශ **දෙකක්** නම් කරන්න.
(ix) සෝල්බරි ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ මගින් ශ්‍රී ලංකාවට එක්වූ අංග **දෙකක්** නම් කරන්න.
(x) ස්විට්සර්ලන්ත සන්ධීය ක්‍රමයේ සුවිශේෂ ලක්ෂණ **දෙකක්** සඳහන් කරන්න.

(ලකුණු 02 × 10 = 20 යි)

(i)

- කාන්තා හා ළමා

**(ලකුණු** 02)

(ii)

- නේටෝ, වෝර්සෝ

**(ලකුණු** 02)

(iii)

- අමුද්‍රව්‍ය - භූමිය, ඛනිජ සම්පත්, රසායනික මූල ද්‍රව්‍ය, දැව, ශාක, සත්ත්ව,ආහාර
- ශක්ති - සූර්ය බලය, පොසිල ඉන්ධන, ජීව වායු, භූතාපය, ජල විදුලිය, සුළං බලය

***(ප්‍රධාන කරුණු දෙක හෝ ඒ යටතේ ඇති අනු කරුණු අතරින් දෙකක් ලියා ඇත්නම්)***
(ලකුණු 02)

(iv)

- ජන මතය නියෝජනයට ඇති ඉඩකඩ පුළුල් වීම
- අත්තනෝමතික පාලනයක් බිහිවීම වළක්වාලීම.
- ආණ්ඩු පක්ෂයේ අහිතකර ප්‍රතිපත්ති විවේචනය කිරීම තුළින් ඒවා නිවැරදි කර ගැනීමට අවස්ථාව සැලසීම
- ජන සමාජයේ පවතින විවිධත්වය නිරූපනය වීමට අවස්ථාව සැලසීම
- බහුවිධතාව තුළින් එක්සත් බව ගොඩ නැඟීම
- ඡන්ද දායකයාට තෝරා ගැනීමේ අවස්ථා වැඩි වීම

**(මෙවැනි හේතු දෙකක් දැක්වීමට)**

**(ලකුණු** 02)

(v)

- මහජන සහභාගිත්වය
- දූෂණයෙන් හා වංචාවෙන් තොර රාජ්‍ය පාලනය හා පරිපාලනය
- නිදහස හා සාධාරණත්වය තහවුරු වීම
- නීතියේ ආධිපත්‍යයට ගරු කිරීම
- අධිකරණයේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීම
- අයිතිවාසිකම් සුරැකීම හා තහවුරු කිරීම
- මාධ්‍ය නිදහස ආරක්ෂා කිරීම
- විනිවිදභාවයෙන් යුතුව කටයුතු කිරීම
- සම්පත් කාර්යක්ෂමව හා ප්‍රතිඵලදායි අයුරින් භාවිතයට ගැනීම
- ගුණාත්මක දේශපාලන සමාජානුයෝජනයට අවශ්‍ය පසුබිම සැකසීම
- ව්‍යවස්ථානුකූලවාදය ආරක්ෂා කිරීම හා රැක ගැනීම
- වගකීම

(මෙවැනි කරුණු දෙකකට)
(ලකුණු 02)

(vi)

- දේශීය නීතිය
- අන්තර්ජාතික නීතිය

(මෙවැනි ගැටලු දෙකකට)
(ලකුණු 02)

(vii)

- සාකච්ඡා කිරීම
- සහමන්ත්‍රණය හා කේවල් කිරීම
- මැදිහත්කරණය
- සමථකරණය
- බේරුම් කිරීම
- විනිසීම
- උපදේශනය

(මෙවැනි ක්‍රම දෙකකට)
(ලකුණු 02)

(viii)

- ආර්ථික සංවර්ධනය
- පුද්ගල සංවර්ධනය
- සංස්කෘතික සංවර්ධනය
- සමාජ සංවර්ධනය
- සදාචාර/ සාරධර්ම සංවර්ධනය
- සාක්ෂරතාවය සංවර්ධනය
- තිරසර සංවර්ධනය

(මින් ඕනෑම කරුණු දෙකක් සඳහන් කිරීමට)
(ලකුණු 02)

(ix)

- කැබිනට් ආණ්ඩු ක්‍රමයක් හඳුන්වා දීම
- ද්වි මණ්ඩලය පාර්ලිමේන්තුව හඳුන්වා දීම
- අග්‍රාණ්ඩුකාර ධුරයක් ඇති කිරීම
- අවසාන අභියාචනා අධිකරණය ලෙස බ්‍රිතාන්‍ය ප්‍රිවි කවුන්සලය පිළිගැනීම
- රාජ්‍ය සේවා හා අධිකරණ සේවා කොමිෂන් සභා පිහිටුවීම
- සුළු ජාතීන්ගේ අයිතිවාසිකම් සම්බන්ධ නීති ඇතුළත් වීම

(මින් ඕනෑම කරුණු දෙකකට)
(ලකුණු 02)

(x)

- මධ්‍යම ආණ්ඩුව හා කැන්ටන් සතු බලතල දක්වා ඇති අතර, ඉතිරි සියලු බලතල මධ්‍යම ආණ්ඩුවට හිමි වීම.
- බලතල ක්‍රියාත්මක වීමේදී මතුවන ගැටලු විසඳීමට බලය, සන්ධිය මහා මණ්ඩලය සතුවීම.
- කැන්ටන්වලට තම බලය ක්‍රියාවට නැංවීමට හා ස්වාධීනව කටයුතු කිරීමට අවස්ථාව අහිමි වීම.
- කැන්ටන් විසින් සිය තීරණ ගැනීමේදී මහජන අදහස් විමසීමට සෘජු ප්‍රජාතන්ත්‍රවාදී උපක්‍රම භාවිතය

(මින් ඕනෑම කරුණු දෙකකට)
(ලකුණු 02)

**2.** ගැටුම් ඇති වීම පුද්ගලයාට මෙන්ම සමාජයට ද සෘජුවම බලපායි.

(i) ගැටුමක් ඇති වීමට බලපාන හේතු **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(ii) අන්තර්ජාතික වශයෙන් ගැටුම් ඇති විය හැකි අවස්ථා **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) ගැටුම් විසඳීම සඳහා සමථකරණය යොදාගත හැකි අවස්ථා **තුනක්** නම් කර, ඉන් එකක් යොදාගන්නා ආකාරය විස්තර කරන්න. (ලකුණු 05 යි)

(i)

- විවිධ ප්‍රතිරූප
- වෙනත් අදහස්
- සීමා ඇතිවීම
- මානසික තත්ත්ව
- පරමාර්ථ ඉටු නොවීම

**(ගැටුම් ඇතිවන මුල ලියා ඇත්නම් ලකුණු නොලැබේ)**
**(මෙවැනි ඕනෑම කරුණු දෙකකට)**
**(ලකුණු 02)**

(ii)

- දේශපාලන මතවාද
- ආර්ථික මතවාද
- සමාජයීය මතවාද
- බලකාමය / බල ව්‍යාප්තිය
- ආර්ථික ප්‍රතිලාභ
- දේශ සීමා ආරවුල්
- සම්පත් බෙදීයාම
- අනවසර සංක්‍රමණ

**(මෙවැනි කරුණු තුනට)**
**(ලකුණු 03)**

(iii)

- පවුල් ආරවුල්
- කම්කරු ආරවුල්
- පුද්ගල කණ්ඩායම් අතර ගැටුම්
- පොදු දේපල සම්බන්ධ ගැටුම්
- සුළු වැරදි විසඳීම
- ඉඩම් ආරවුල්
- නින්දා අපහාස, දේපල හානි කිරීම්

**(මෙවැනි කරුණු තුනක් නම් කිරීමට ලකුණු 03)**
**(එකක් විස්තර කිරීමට ලකුණු 02)**
**(මුළු ලකුණු 05)**

| | | |
|---|---|---|
| **3.** | ආර්ථිකයක සිදුවන ක්‍රියාවලි අතර නිෂ්පාදන ක්‍රියාවලිය වැදගත් වේ. | |
| (i) | නිෂ්පාදන සාධක **දෙකක්** නම් කරන්න. | (ලකුණු 02 යි) |
| (ii) | ආර්ථිකයක නිෂ්පාදන ක්‍රියාවලිය සිදුවන ප්‍රධාන අංශ **තුන** සඳහන් කරන්න. | (ලකුණු 03 යි) |
| (iii) | නිෂ්පාදිත භාණ්ඩ පරිභෝජනය කෙරෙන ආකාර අනුව බෙදිය හැකි කොටස් **තුන** නම් කර, ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න. | (ලකුණු 05 යි) |

(i)

- භූමිය
- ශ්‍රමය
- ප්‍රාග්ධනය
- ව්‍යවසාය

**(මින් දෙකක් නම් කිරීමට)**
**(ලකුණු 02)**

(ii)

- කෘෂි කාර්මික
- කාර්මික
- සේවා

**(ඉහත අංශ තුන නම් කිරීමට)**
**(ලකුණු 03)**

(iii)

- භාණ්ඩ ප්‍රයෝජනයට ගන්නා ආකාරය අනුව බෙදිය හැකි කොටස් තුන
  01. පාරිභෝගික භාණ්ඩ
  02. අන්තර් භාණ්ඩ
  03. ප්‍රාග්ධන භාණ්ඩ

**(මෙවැනි කරුණු තුනක් නම් කිරීමට ලකුණු 03)**
**(එකක් විස්තර කිරීමට ලකුණු 02)**
**(මුළු ලකුණු 05)**

4. ශ්‍රී ලංකාවේ නීතිය ක්‍රියාත්මක කිරීම සඳහා විවිධ අධිකරණ ආයතන පිහිටුවා තිබේ.

(i) ශ්‍රී ලංකාවේ අධිකරණ පද්ධතියේ ඉහළම අධිකරණ **දෙක** පිළිවෙළින් නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන විශේෂ නීති වර්ග **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) රටක නීති පැනවීමට බලපාන සාධක **තුනක්** නම් කර, ඉන් එකක් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

(i)

- ශ්‍රේෂ්ඨාධිකරණය
- අභියාචනාධිකරණය

**(ලකුණු 02)**

(ii)

- උඩරට නීතිය
- තේසවලාමේ නීතිය
- මුස්ලිම් නීතිය (ෂරියා නිතීය)

**(ලකුණු 02)**

(iii)

- මානව හැසිරීම් පාලනය කිරීම සඳහා
- මහජනතාවගේ ජීවිත ආරක්ෂා කිරීම
- මානව හිමිකම් ආරක්ෂා කිරීම
- දේපළ ආරක්ෂාව
- රට තුළ ස්ථාවරත්වයක් ඇති කිරීම
- අවනීතිය ක්‍රියාත්මක වීම වැළැක් වීම
- ආර්ථික, දේශපාලන, සමාජ සංස්කෘතික සංවර්ධනය

**(මෙවැනි කරුණු තුනක් නම් කිරීමට ලකුණු 03)**
**(ඉන් එකක් විස්තර කිරීමට ලකුණු 02)**
**(මුළු ලකුණු 05)**

5. රාජ්‍යයක බලය මධ්‍යම ආණ්ඩුව හා ප්‍රාන්ත ආණ්ඩු අතර බෙදා ගැනීම සන්ධීය රාජ්‍යය නම් වේ.

(i) සන්ධීය ආණ්ඩු පවතින රටවල් **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) සන්ධීය ආණ්ඩු ක්‍රමයක් ඇති වීමට බලපාන කරුණු **තුනක්** දක්වන්න. (ලකුණු 03 යි)

(iii) සන්ධීය ආණ්ඩු ක්‍රමයක අයහපත් ලක්ෂණ **තුනක්** සඳහන් කර, ඉන් එකක් විස්තර කරන්න. (ලකුණු 05 යි)

(i)

- ඇමරිකා එක්සත් ජනපදය
- ස්විස්ටර්ලන්තය
- ඕස්ට්‍රේලියාව
- ඉන්දියාව
- කැනඩාව

**(මින් දෙකක් නම් කිරීමට)**

**(ලකුණු 02)**

(ii)

- ජාතික ආරක්ෂාව
- විදේශ වෙළඳාම හා විදේශ කටයුතු
- ජාතික ආර්ථික සංවර්ධනය
- සංස්කෘතික විවිධත්වය
- භූමියේ විශාලත්වය

**(මෙවැනි කරුණු තුනක් නම් කිරීමට)**

**(ලකුණු 03)**

(iii)

- ප්‍රාන්ත ආණ්ඩු ලැබෙන බලතලවලින් තෘප්තිමත් නොවීම
- වෙන්ව යාම හෝ ස්වාධීන වීමට උත්සාහ ගැනීම
- තීරණ ගැනීමේදී ගැටලු මතුවීම හා පරිපාලන ගැටලු මතුවීම
- ව්‍යවස්ථා සම්පාදන ක්‍රියාවලිය ප්‍රමාද වීම
- ප්‍රාන්ත පරිපාලන අත්දැකීම් අවම වීම නිසා පරිපාලනය බිඳ වැටීම

**(මෙවැනි කරුණු තුනක් නම් කිරීමට ලකුණු 03)**

**(එකක් විස්තර කිරීමට ලකුණු 02)**

**(මුළු ලකුණු 05)**

6. ආර්ථික වර්ධනය හා සංවර්ධනය යනු එකිනෙකට වෙනස් සංකල්ප දෙකකි.

(i) 'සංවර්ධනය' යන සංකල්පය අර්ථ දක්වන්න. (ලකුණු 02 යි)

(ii) සංවර්ධනය වෙමින් පවත්නා රටක් වශයෙන් පැවතිය ද ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන සංවර්ධිත රටවලට අයත් ලක්ෂණ **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)

(iii) ශ්‍රී ලංකාවේ සංවර්ධන අභියෝගය ජය ගැනීමට ගෙන ඇති ක්‍රියාමාර්ග **තුනක්** සඳහන් කර, ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05 යි)

(i)

"සංවර්ධනය යනු ලෝක ජනතාවගේ ජීවන තත්ත්වය වැඩි දියුණු කිරීමයි"
1961 - 70 සංවර්ධන දශකය
- එක්සත් ජාතීන්ගේ සංවිධානය -

"රටක ආර්ථික සංවර්ධනය සමග සාමාජයීය සංවර්ධනයක් ඇති විය යුතු ය."
සාමාජයීය සංවර්ධනය සිදුවිය යුත්තේ ආහාර, පෝෂණ, සෞඛ්‍යය, අධ්‍යාපනය, නිවාස, සමාජ සුරක්ෂිතභාවය, ඇඳුම් පැළඳුම්, විවේකය හා මානුෂීය නිදහස යනාදියෙහි ය.
1978 යුනෙස්කෝ ප්‍රකාශනය

"සංවර්ධනය යනු ජන සංඛ්‍යාව, සමාජයීය, සංස්කෘතික හා සදාචාරාත්මක යන සාධක ඇතුළත් වෙනස්වීම් හා වර්ධනය පිළිබඳ ක්‍රියාදාමයකි"
1961 - 70 සංවර්ධන දශකය
- එක්සත් ජාතීන්ගේ සංවිධානය -

"අනාගත පරම්පරාවේ අවශ්‍යතාවලට අවහිර නොවන පරිදි වර්තමාන අවශ්‍යතා ඉටු කර ගැනීම තිරසාර සංවර්ධනය යි"
- බ්‍රුරුන්ඩ්ට්ලන්ඩ් කොමිසම -

" ආර්ථික, දේශපාලන, සමාජ හා මානව යන අංශයන්ගෙන් දියුණුවීම හා දරිද්‍රතාව අවම වීමත් සමග තිරසර දියුණුව ඇති කිරීම සංවර්ධනයයි"
- එක්සත් ජාතීන්ගේ සංවර්දන වාර්තාව, 2000 -

" සංකීර්ණ සංස්කෘතික හා පාරිසරික සාධක ඒවායේ අන්තර් ක්‍රියාකාරීත්වය මත ඇතිවන ආර්ථික හා සමාජීය පරිණාමන ක්‍රියාවලිය සංවර්ධනයයි"
www.business dictionary.com.2013.08.12

**(ඉහත නිර්වචන ඉදිරිපත් කළ අයගේ නම් හෝ වර්ෂ අනිවාර්ය නැත. ඉහත අර්ථයක් හෝ ඒ හා සමාන අදහසක් ඇතුළත් අර්ථකථනයකට ද ලකුණු දෙන්න.)**

**(ලකුණු 02)**

(ii)

- සාක්ෂරතාව ඉහළ මට්ටමක පැවතීම
- ආයු අපේක්ෂාව ඉහළ මට්ටමක පැවතීම
- ළදරු හා මාතෘ මරණ අනුපාතය පහළ මට්ටමක පැවතීම

(ලකුණු 03)

(iii)

- අපනයන විවිධාංගීකරණය
- දේශීය ඉතුරුම් දිරි ගැන්වීම
- යටිතල පහසුකම් සංවර්ධනය
- සංචාරක කර්මාන්තය දියුණු කිරීම
- දේශීය විදේශීය ආයෝජකයන් දිරි ගැන්වීම
- අපනයන අභිමුඛ කර්මාන්ත දියුණු කිරීම
- තාක්ෂණික දැනුම හා කුසලතා පුළුල් කිරීම
- දේශපාලන ස්ථාවරත්වය ගොඩ නැගීම
- නාවික, අධ්‍යාපනික, තොරතුරු තාක්ෂණික, කේන්ද්‍රස්ථානයක් බවට ශ්‍රී ලංකාවට පත්වීම
- බහු කාර්ය සංවර්ධන ව්‍යාපෘති යෝජනා ක්‍රම

(මෙවැනි කරුණු තුනක් නම් කිරීමට ලකුණු 03)
(එකක් විස්තර කිරීමට ලකුණු 02)
(මුළු ලකුණු 05)

**7.** ලෝකයේ විවිධාකාර කලාපීය සංවිධාන බිහි වේ.

(i) කලාපීය සංවිධාන ඇති වීමට බලපෑ මූලික හේතු **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ii) ආසියාන් සංවිධානයේ සාමාජික රටවල් **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)

(iii) ආසියාන් සංවිධානයේ අරමුණු **දෙකක්** සඳහන් කර, ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

(i)

1. රාජ්‍ය උපාය සම්බන්ධතා
2. යුධ උපාය සම්බන්ධතා
3. ප්‍රබල රටවල් ඇති කරන බලපෑම් වලින් ආරක්ෂා වීම
4. කලාපීය රාජ්‍යයන්ගේ සංවර්ධනය
5. ආර්ථික සහයෝගීතාවය

**(මෙවැනි කරුණු දෙකක් සඳහා)**

**(ලකුණු 02)**

(ii)

- ඉන්දුනීසියාව, සිංගප්පූරුව, තායිලන්තය, පිලිපීනය, මැලේසියාව, වියට්නාමය, බෲනායි, මියන්මාරය, මැලේසියාව, ලාඕසය

**(මින් රටවල් තුනක් නම් කිරීම සඳහා)**

**(ලකුණු 03)**

(iii)

1. සහයෝගීතාව මත ඒකාබද්ධ ආර්ථික ක්‍රමයක් සාමාජික රටවල් ක්‍රියාත්මක කිරීම
2. අන්‍යෝන්‍ය සහයෝගීතාව මත සහයෝගයෙන් පර්යේෂණාත්මක අංශ දියුණු කිරීම
3. කෘෂිකාර්මික සහ කාර්මික ක්ෂේත්‍රයේදී වඩාත් සඵලතාව සඳහා එක්සත්වීම
4. සමාජික රටවල වෙළෙඳ කටයුතු දියුණු කර ගන්නා අතරම ජාත්‍යන්තර වාණිජ කටයුතු වලදී ඇතිවන ප්‍රශ්න හැදෑරීමේ මාර්ග දියුණු කිරීම
5. සාමාජික රටවල ජන ජීවිතය උසස් කිරීම හා සන්නිවේදන මාර්ග දියුණු කිරීම

**(මින් දෙකක් නම් කිරීමට ලකුණු 02)**
**(විස්තර කිරීමට ලකුණු 03)**
**(මුළු ලකුණු 05)**

# 10 සහ 11 ශ්‍රේණි සඳහා ග්‍රන්ථ නාමාවලිය

## (අ.පො.ස) සාමාන්‍ය පෙළ
## 11 ශ්‍රේණිය - කෙටි සටහන්

**සිංහල මාධ්‍ය**

- ☐ 10-11 සිංහල ව්‍යාකරණ
- ☐ 10-11 සිංහල සාහිත්‍යය රසාස්වාදය
- ☐ බුද්ධ ධර්මය
- ☐ කතෝලික ධර්මය
- ☐ සිංහල භාෂාව හා සාහිත්‍යය
- ☐ සිංහල සාහිත්‍යය සංග්‍රහය
- ☐ English Language
- ☐ ගණිතය - 1
- ☐ ගණිතය - 2
- ☐ ජීව විද්‍යාව
- ☐ භෞතික විද්‍යාව
- ☐ රසායන විද්‍යාව
- ☐ ඉතිහාසය
- ☐ ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය
- ☐ භූගෝල විද්‍යාව
- ☐ පුරවැසි අධ්‍යාපනය
- ☐ පෙරදිග සංගීතය
- ☐ නර්තනය
- ☐ නාට්‍ය හා රංග කලාව
- ☐ චිත්‍ර කලාව
- ☐ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය
- ☐ සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය
- ☐ සෞඛ්‍යය හා ශාරීරික අධ්‍යාපනය
- ☐ කෘෂි හා ආහාර තාක්ෂණය
- ☐ ගෘහ ආර්ථික විද්‍යාව

## 11 ශ්‍රේණිය - ප්‍රශ්නෝත්තර

**සිංහල මාධ්‍ය**

- ☐ සිංහල භාෂාව හා සාහිත්‍යය
- ☐ බුද්ධ ධර්මය
- ☐ ඉතිහාසය
- ☐ ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය
- ☐ පුරවැසි අධ්‍යාපනය

## Grade 11 - Short Notes

**English Medium**

- ☐ Buddhism
- ☐ Mathematics - 1
- ☐ Mathematics - 2
- ☐ Biology
- ☐ Physics
- ☐ Chemistry
- ☐ History
- ☐ Business & Accounting Studies
- ☐ Geography
- ☐ Civic Education
- ☐ ICT
- ☐ Health & Physical Education
- ☐ 10-11 English Literary (Poetry)
- ☐ 10-11 English Literary (Drama)
- ☐ 10-11 English Literary (Short Story)

## Grade 11 - Model Papers

**English Medium**

- ☐ Civic Education

## 10 ශ්‍රේණිය - කෙටි සටහන්

**සිංහල මාධ්‍ය**

- ☐ බුද්ධ ධර්මය
- ☐ කතෝලික ධර්මය
- ☐ සිංහල භාෂාව හා සාහිත්‍යය
- ☐ සිංහල සාහිත්‍යය සංග්‍රහය
- ☐ සිංහල රචනා අත්වැල
- ☐ English Language
- ☐ ගණිතය - 1
- ☐ ගණිතය - 2
- ☐ ජීව විද්‍යාව
- ☐ භෞතික විද්‍යාව
- ☐ රසායන විද්‍යාව

## Grade 10 - Short Notes

**English Medium**

- ඉතිහාසය
- ඉතිහාසය රූප සටහන් අශ්‍රිත කෙටි සටහන්
- ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය - 1
- ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය - 2
- භූගෝල විද්‍යාව
- පුරවැසි අධ්‍යාපනය
- පෙරදිග සංගීතය
- නර්තනය
- නාට්‍ය හා රංග කලාව
- චිත්‍ර කලාව
- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය
- සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය
- සෞඛ්‍යය හා ශාරීරික අධ්‍යාපනය
- කෘෂි හා ආහාර තාක්ෂණය
- ගෘහ ආර්ථික විද්‍යාව
- ජපන් භාෂාව

- Buddhism
- Mathematics - 1
- Mathematics - 2
- Biology
- Physics
- Chemistry
- History
- Business & Accounting Studies - 1
- Business & Accounting Studies - 2
- Geography
- Civic Education
- ICT
- Health & Physical Education

## 10 ශ්‍රේණිය - ප්‍රශ්නෝත්තර

**සිංහල මාධ්‍ය**

- සිංහල භාෂාව හා සාහිත්‍යය
- බුද්ධ ධර්මය
- ගණිතය
- විද්‍යාව
- ඉතිහාසය
- පුරවැසි අධ්‍යාපනය
- භූගෝල විද්‍යාව
- පෙරදිග සංගීතය

## Grade 10 - Model Papers

**English Medium**

- Mathematics
- Science
- Civic Education
- Geography
- English Activity Book
- English Work Book

## පාඩමෙන් පාඩමට මාසික ඇගයීම්

**සිංහල මාධ්‍ය**

- 10-ශ්‍රේණිය - විද්‍යාව
- 11-ශ්‍රේණිය - විද්‍යාව

## අනෙකුත් ග්‍රන්ථ

- හෙළදිව කතිකාවත - අරුණශාන්ත අමරසිංහ
- හොල්මන් අවතාර සහ යකදුරන් - අරුණශාන්ත අමරසිංහ
- සිසු-ගුරු අත්පොත නාට්‍ය හා රංග කලාව 10-11 ශ්‍රේණි සඳහා (නව විෂය නිර්දේශය) - නන්දන අල්ගේවත්ත

සියලු ම ශ්‍රේණි සඳහා කෙටි සටහන්, ප්‍රශ්න පත්‍ර කට්ටල සහ වැඩ පොත් අප සතුව තිබෙන අතර, මෙම ඕනෑම ග්‍රන්ථයක් වට්ටම් සහිත ව ඔබේ නිවසට ම ගෙන්වා ගත හැකි ය.